# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1778/44 - 2012 ඔක්තෝබර් මස 05 වැනි සිකුරාදා - 2012.10.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

*මගේ අංකය* : IR/10/28/2007 (A).

### කාර්මික ආරවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරවුල් පනතේ 4(1) වගන්තිය යටතේ, 2009.11.27 දිනැති හා අංක 1629/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2009.11.19 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් උස්වැටකෙයියාව, පට්ටියවල, අංක 272/B හි පදිංචි එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, ඇවිලන් චතුරස්‍රය, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, බටහිර කුළුණ, අංක 21-01 හි පිහිටි ඒසියා කැපිටල් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2012.08.13 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

වී. බී. පී. කේ. වීරසිංහ,
කම්කරු කොමසාරිස්.

2012 සැප්තැම්බර් මස 24 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා,
අංක 272/බී, පට්ටියවල,
උස්වැටකෙයියාව.

(පළමු පාර්ශ්වය)

*නඩු අංකය* : A–3309

*සහ*

ඒසියා කැපිටල් ලිමිටඩ්,
අංක 21-01, බටහිර කුළුණ,
ලෝක වෙළඳ මධ්‍යස්ථානය,
ඇවිලන් චතුරස්‍රය,
කොළඹ 01.

(දෙවැනි පාර්ශ්වය)

අතර පවත්නා කාර්මික ආරවුල පිළිබඳවයි.

ප්‍රදානය

වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39, (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වැනි පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතින් 4(1) වැනි වගන්තිය යටතේ ගරු කම්කරු සබඳතා සහ මිනිස්බල ඇමතිතුමාට පැවරී ඇති බලතල අනුව, උක්ත ආරවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2009.11.19 දිනැති නියෝගයෙන් මා පත් කොට එය මා වෙත යොමු කර ඇත.

දෙපාර්ශ්වය අතර පවත්නා කාර්මික ආරවුලට හේතුව,

"ඒසියා කැපිටල් ලිමිටඩ් විසින් 2003.02.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කාර්යාල සහකාර වශයෙන් සේවයට බඳවා ගනු ලැබූ එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා 2007 ජූලි මස 01 දින සිට කැමැත්තෙන් සේවය අතහැර ගියා සේ සැලකීම යුක්තිසහගත ද යන්න හා යුක්තිසහගත නොවන්නේ නම්, ඔහුට කුමන සහනයක් හිමි ද යන්න පිළිබඳව වේ."

මෙම කාර්මික ආරවුලට මුල්ව ඇත්තේ මෙහි සේවක එස්.ඩී.එස්.ඒ. රේමන්ඩ් මහතා 2007 අප්‍රේල් මස 01 දින සිට සිය කැමැත්තෙන්ම සේවය අත්හැර ගියාද යන ප්‍රශ්නයයි.

2010.01.11 දින ඉහත කී ආරවුල පිළිබඳ විමර්ශන කටයුතු ආරම්භ කරන ලදී. ඉල්ලුම්කරු තම පළමු ප්‍රකාශය සමඟ A1, A2, A3, A4, සහ A5 ලෙස ලකුණු කරන ලද ලේඛන ද පළමු ප්‍රකාශය ද ඉදිරිපත් කරන ලදී.

එයින් අනතුරුව 2010.02.10 වෙනි දින පාර්ශවයන් විසින් තම තමන්ගේ දෙවැනි ප්‍රකාශය ඉදිරිපත් කළ අතර සමථයක් හෝ වැඩිදුර විභාගය සඳහා 2010.03.04 වැනි දිනට කල් දමන ලදී.

2010.03.04 වැනි දින ආරවුල පිළිබඳව විභාගය ආරම්භ කළ අවස්ථාවේ වගඋත්තරකාර පාර්ශ්වය විසින් තමන් විසින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවය පළමුවෙන් තීරණයක් කළ යුතු බව කියා සිටියෙන් ඒ මත පළමු පාර්ශ්වය සහ දෙවැනි පාර්ශ්වය නියෝජනය කරන නීතිඥ මහතුන් විසින් වාචිකව කරුණු සැල කර සිටින ලදී. ඉහත කී මූලික විරෝධතාවයන්ගේ හරය වී ඇත්තේ පළමු පාර්ශ්වය වන එස්. ඩී. ඒ. එස්. රේමන්ඩ් මහතා 2007.07.01 දින සිට සිය කැමැත්තෙන් සේවය අත්හැර ගොස් ඇති බැවින් එය කාර්මික ආරවුල් පනත යටතේ බේරුම්කිරීමට තරම් ආරවුලක් නොපවතින බවයි.

ඉහත කී පරිදි පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු වලට සවන් දීමෙන් සහ ඉදිරිපත් කර ඇති ලේඛන සහ කොමසාරිස් තුමාගේ 2009.09.16 වෙනි දින ලිපිය හා වගඋත්තරකාර පාර්ශ්වයේ 2008 සැප්තැම්බර් 05 වෙනි දින ලිපිය සලකා බැලීමෙන් පැහැදිලි වන්නේ මෙම පරීක්ෂණයෙන් විසඳිය යුතු වන්නේ ද කොමසාරිස් තුමා විසින් ඉදිරිපත් කර ඇති ආරවුල සහ වගඋත්තරකාර පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති මූලික විරෝධතාවය ද එකම කරුණු වන බැවින්/වගඋත්තරකාර පාර්ශ්වයෙන් පළමු පාර්ශ්වයට යවා ඇති "R2" සහ "R4" ලිපි 2ක මගින් ස්ථරයන් 2ක් මත පිහිටා ක්‍රියා කර ඇති බව පෙනෙන්නට තිබෙන බැවින් ද එකී කරුණ තීරණය කිරීම සඳහා වැඩිදුරටත් සාක්ෂි සහ ලේඛන පුළුල් ලෙස සලකා බලා අවසාන වශයෙන් තීරණය කිරීම සඳහා වැඩිදුර විභාගයට නියම කරන ලදී.

ඉන්පසු 2010.06.01 දින ආරවුල පිළිබඳ වැඩිපුර විභාගය ආරම්භ කරන ලදී. ආරම්භයේදී වගඋත්තරකාර සමාගමේ මිනිස් බල හා පරිපාලන ජ්‍යෙෂ්ඨ කළමණාකරු පීටර් නෙවිල් ජැන්සන් මහතා සාක්ෂි සඳහා කැඳවන ලදී. පීටර් නෙවිල් ජැන්සන් මහතා මූලික සාකෂි වලින් පසුව පළමු පාර්ශ්වය විසින් හරස් ප්‍රශ්න කිරීමෙන් පසුව වගඋත්තරකාර පාර්ශ්වය විසින් නැවත ප්‍රශ්න ඇසීම මෙහෙයවන ලදී.

වගඋත්තරකාර පාර්ශවයේ එකම සාක්ෂිකරු වූ පීටර් නෙවිල් ජැන්සන් මහතාගේ සාක්ෂි දීමෙන් පසු වගඋත්තරකාර පාර්ශවය තම සාක්ෂි මෙහෙයවීම අවසන් කරන ලදින් 2010.11.24 වැනි දින පළමු පාර්ශවයේ සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලදී.

මෙහිදී පළමු පාර්ශ්වකාර එස්.ඩී.එස්.ඒ. රේමන්ඩ් මහතාගේ සාක්ෂි සටහන් කර ගන්නා ලදී. එකී සාක්ෂිකරුගෙන් මූලික සාක්ෂි වලින් පසුව හරස් ප්‍රශ්න ඇසීමෙන් අනතුරුව නැවත ප්‍රශ්න කිරීමෙන් පසු 2011.04.04 දින පළමු පාර්ශ්වයේ නඩුව අවසන් කරන ලදී.

අවසානයේදී පළමු පාර්ශ්වය විසින් ලිඛිත දේශණ ඉදිරිපත් කර ඇති නමුත් නඩු විභාගයේදී ලකුණු කරන ලද ලේඛන ඒ සමඟ ඉදිරිපත් කර නොමැත. එහෙත් R1 - R4 දක්වා ලේඛන නඩු පොතේ ඇති බවට සඳහන් කර ඇත. වගඋත්තරකාර පාර්ශ්වය ද පළමු පාර්ශ්වයෙන් ලකුණු කර ඇති එම ලේඛන R1 සිට R4 දක්වා ලකුණු කර සිය ලිඛිත දේශණය සමඟ ඉදිරිපත් කර ඇත.

**තීරණය සඳහා සැලකිල්ලට ගත් කරුණු :-**

(අ) සේවක එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා ඒෂියා කැපිටල් ලිමිටඩ් සේවයෙක් ද නැතහොත් එහි සභාපතිගේ පුද්ගලික සේවකයෙක් වූයේ ද?

(ආ) සේවක රේමන්ඩ් 2007 ජූලි මස 01 වැනි දින සිට සේවයට වාර්තා නොකර සේවය අත්හැර ගියා සේ සැලකිය හැකි ද නැතහොත් 2007 ජූලි 01 වැනි දින සිට සේවයෙන් අස් වූවා සේ සැලකෙන්නේද?

(ඇ) ඉහත (ආ) හි සඳහන් පරිදි සේවය අත්හැර ගියා සේ හෝ සේවයෙන් අස් වී ගියා සේ සැලකීමෙන් එකී සේවක මහතාට යම් අසාධාරණයක් සිදු වී ඇත් ද?

(ඈ) එලෙස අසාධාරණයක් සිදු වී ඇත්නම් ලැබිය යුතු සහනයන් මොනවාද යන්නයි.

ඉහත සඳහන් කරුණු ඉදිරිපත් කර ඇති සාක්ෂිවලට අනුව පහත සඳහන් පරිදි තීරණය කළෙමි.

(අ) සේවක එස්. ඩී. එස්. ඒ. රේමන්ඩ් මහතා ඒෂියා කැපිටල් ලිමිටඩ් හි සේවකයෙක් ද නැතහොත් එහි සභාපතිගේ පුද්ගලික සේවකයෙක් වූයේ ද?

ඉහත සඳහන් කරුණ තීරණය කිරීමේදී "R1" ලෙස ඉදිරිපත් කර ඇති ලේඛනය ඉතාම වැදගත් සාක්ෂියක් වන්නේය. එකී ලිපියට අනුව මෙම සේවක මහතා කාර්යාල සහායක වශයෙන් පත් කර ඇති අතර, එහි දෙවන සේවා කොන්දේසියට අනුව විටින් විට සභාපතිගේ තීරණයට අනුව කාර්යාලයට අයත් සේවාවන්හි දී එම සේවක සේවයන් හි යෙදවිය හැකිය. 6 වැනි කොන්දේසියට අනුව පරිපාලනයේ කැමැත්ත පරිදි දිනකට සේවය කරන පැය ගණන තීරණය කළ හැකිය. 7 වැනි කොන්දේසියට අනුව වගඋත්තරකාර සමාගම සේ.අ.අ. අරමුදලට දායක වන්නේය. 9 වැනි කොන්දේසියට අනුව බෝනස් දීම වගඋත්තරකාර සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලයේ තීරණයට අනුව සිදු වේ. 10 සහ 11 වෙනි කොන්දේසි අනුව වෛද්‍ය, රක්ෂණ ආදී අනෙකුත් ප්‍රතිලාභයන් ද, සේවක ආචාර පද්ධතිය ද වගඋත්තරකාර සමාගමේ අනෙකුත් සේවක ගිවිසුම මෙන් වන්නේය. මෙම පත්වීමේ ලිපිය නිකුත් කර ඇත්තේ වගඋත්තරකාර සමාගමේ පාලන අධ්‍යක්ෂකවරයාගේ අත්සනින් ය. ඒ අනුව සලකා බැලීමේදී මෙම සේවක මහතා සභාපතිගේ පුද්ගලික සේවකයෙකු නොව ඒෂියා කැපිටල් ලිමිටඩ් ආයතනයේ සේවකයෙකු බව ස්ථිර වන්නේය.

(ආ) දෙවනුව සලකා බැලිය යුතු වන්නේ මෙම සේවක මහතා 2007 ජූලි මස 01 දින සිට සේවයට වාර්තා නොකර සේවය අත්හැර ගියා සේ සැලකිය හැකිද? නැතහොත් 2007 ජූලි මස 01 වැනි දින සිට සේවයෙන් අස් වූවා සේ සැලකෙන්නේ ද යන්නයි.

ඉහත සඳහන් කරුණ සම්බන්ධයෙන් වගඋත්තරකාර සමාගම විසින් ඉදිරිපත් කර ඇති ලේඛනමය සාක්ෂි වන්නේ R2, R3 සහ R4 දරන ලේඛනයන් සහ එකම සාක්ෂිකරු වන පී. එන්. ජැන්සන් මහතාගේ සාක්ෂියයි.

මෙම ආරවුලට මූලික වූ සිද්ධිය ඇති වී තිබෙන්නේ 2007 ජූලි මස 01 වැනිදා හෝ ආසන්න කාලයකදී ය. (2010.11.26 වෙනි දින සාක්ෂි සටහන් 99 වෙනි පිටුව) ඒ කාලය තුළ මෙම ආයතනය වෙනුවෙන් සාක්ෂි දෙන පී. එන්. ජැන්සන් මහතා මෙම ආයතනයේ සේවයේ නොමැත. ඔහු තමා සේවයට බැඳීමට පෙර වූ සිද්ධීන්

පිළිබඳ දැනීම ලබා ගත්තේ කෙසේ ද යන්න මෙහිදී පැහැදිලි කර නැතුවා පමණක් නොව එම සිද්ධීන් පිළිබඳව තමන් දෙන සාක්ෂිය ප්‍රවාදක සාක්ෂි (hear sayevidence) බව පිළිගෙන ඇත. (2010.08.25 වැනි දින සාක්ෂි සටහන් 87 වැනි පිටුව) එබැවින් අදාළ කාල වකවානුව සම්බන්ධයෙන් පී. එන්. ජැන්සන් මහතා විසින් දෙන ලද සාක්ෂිය සම්පූර්ණයෙන්ම බැහැර කරමි.

මෙම සේවක මහතා ස්ව කැමැත්තෙන් සේවයට වාර්තා නොකිරීම පිළිබඳව සාක්ෂි ඉදිරිපත් වී නොමැත සාමාන්‍යයෙන් සේවයට වාර්තා කිරීම 2007 ජුනි මාසයෙන් පසු කඩ වී ඇති බවට සාක්ෂි වශයෙන් සේවකයින්ගේ දෛනිකව සේවයට වාර්තා කිරීමේ සටහන් පොත හෝ ඉදිරිපත් කර නොමැත. එබැවින් මේ සේවක මහතා 2007 ජුනි මාසයෙන් පසු සේවයට වාර්තා නොකලාය යන්න පිළිබඳව ඇති චෝදනාව ප්‍රතික්ෂේප කරමි.

තව ද පාර්ශ්වයන් විසින් ඉදිරිපත් කර ඇති "R1" ලේඛනයේ 5 වෙනි සේවා කොන්දේසියට අනුව සේවකයා විසින් සේවය අත්හැරීම හෝ සේවයෙන් පහ කිරීමේදී මාස 1 ක දැනුම් දීමක් කර තිබිය යුතු ය. මෙවැන්නක් සිදු වී නොමැති බැවින් ද R2 සහ R4 දරන ලිපි යැවීම සඳහා වූ තීරණය කවුරුන් විසින් ගනු ලැබුවේ ද යන්න පිළිබඳව පැහැදිලි සාක්ෂි නොමැති බැවින් ද එකී ලිපි මගින් සේවක මහතා සේවයට වාර්තා නොකර සේවය අත්හැර යෑම හෝ සේවයෙන් අස් වී යෑම පිළිගත නොහැකි වන්නේය.

එබැවින් ඉදිරිපත් වී ඇති අවස්ථාගත කරුණු සියල්ල සැලකිල්ලට ගෙන 2008.09.05 වෙනි දින හෝ ආසන්න දිනකදී සේවක මහතා B Card පත ලබා ගැනීමට කාර්යාලයට ගිය අවස්ථාවේදී "R3" ලේඛන ලියා අත්සන් කර ගත් බවට එම සේවක මහතාගේ සාක්ෂි පිළිගැනීමට තීරණය කරමි.

ඉහත සඳහන් පරිදි ඉදිරිපත් වී ඇති සාක්ෂි සලකා බැලීමෙන් සත්‍යතාවය වැඩි බර සාක්ෂි මත සේවක මහතා 2007 ජූලි මස 01 වැනි දින සිට සිය කැමැත්තෙන් සේවය අත්හැර ගියා සේ සැලකීම යුක්තිසහගත නොවන බවත් ඒ අනුව මෙම සේවක මහතාට අසාධාරණයක් සිදු වී ඇති බවටත් තීරණය කරමි.

ඒ හේතුවෙන් මෙම මහතාට පහත සඳහන් සහනයන් ලැබිය යුතු බවට ද තීරණය කරමි.

මෙම සේවක මහතාගේ පත්වීම් ලිපියට අනුව (R1) ඔහුගේ උපන් දිනය 1945.12.31 බව සඳහන් වේ. ඒ අනුව ඔහුගේ වයස අවු. 65 සපිරෙන්නේ 2010.12.31 වැනි දිනටය. එම සේවක මහතාගේ වැටුප් ගෙවීම 2007 ජූලි මසින් අවසන් කර ඇතත් ඔහුට දිගටම සේවය කිරීමට නොහැකි බාධාවක් පවතින බවට සාක්ෂි නොමැත. "R1" දරන පත්වීම් ලිපියට අනුව ඔහුගේ ආරම්භක වැටුප මසකට රුපියල් 15,000 කි. එයින් පසුව ඔහුට වැටුප් වර්ධක ලැබුණු බව කියා සිටියත් එය සනාථ කිරීම සඳහා ලකුණු කරන ලද ලේඛන මෙම තීරණය සඳහා මා වෙත ඉදිරිපත් කර නොමැත. එබැවින් ඉහත කී මාසික වැටුප රුපියල් 15,000ක් පදනම් කරගෙන 2007 ජූලි මස සිට 2010.12.31 වැනි දින දක්වා මාස 41 කට සේවක මහතාට ගෙවිය යුතු වූ හිඟ වැටුප් වශයෙන් රු. 6,15,000 ක් (රුපියල් හය ලක්ෂ පහලොස්දාහක්) මුදලක් ගෙවිය යුතු බවටත් ඒ අනුව ඔහුට ඔහුගේ පත්වීම් ලිපියේ කොන්දේසි වලට අනුව අනෙකුත් ප්‍රතිලාභයන් ද ලැබිය යුතු බවටත් තීරණය කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්තිසහගත බව මාගේ නිගමනයයි.

එම්. ආරිෆ්,
බේරුම්කරු.

2012 අගෝස්තු මස 13 වැනි දින,
කාර්මික අධිකරණයේ දී ය.

10 - 865

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.